# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009**

**(2010 මැයි / ජූනි)**

**මානවශාස්ත්‍ර පීඨය**

**ක්‍රිස්තියානි සංස්කෘතිය - CHCU E 2015**

**ක්‍රිස්තියානි ශාසනයේ ඉතිහාසය**

**එක් කොටසකින් ප්‍රශ්නදෙකක් (02) ඇතුලත් වන සේ**
**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි          කාලය : පැය 03 යි

---

**<u>පළමුවන කොටස</u>**

01. ක්‍රි. ව. පළමු සියවස් තුනේ දී ක්‍රිස්තියානි සභාව මුහුණදුන් පීඩාවන් (Persecution) හා ඊට හේතු වූ කරුණු පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් කරන්න.

02. ගෝත්‍රික හෙවත් ම්ලේච්ඡ (Tribes / Barbarians) ජනතාව විසින් රෝම අධිරාජ්‍යය ආක්‍රමණය කිරීම හා ක්‍රිස්තියානි සභාවට ඉන් ඇති වූ බලපෑම විස්තර කරන්න.

03. බටහිර ක්‍රිස්තියානි සභාවේ ධර්මාධිකරණවල ( Inquisition) අරමුණ, සාක්ෂි ලබා ගැනීම සඳහා යොදාගත් ක්‍රම සහ වැරදිකරුවන්ට දුන් දඬුවම් පැහැදිළි කරන්න.

04. පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකක් (02)</u>** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    අ. මිලාන් ආඥාවෙන් (ක්‍රි. ව. 313 ) පසුව බිහි වූ ක්‍රිස්තියානි සභාව

    ආ. ඒරියානුවාදය ( Arianism ) හෝ මොනොෆිසිස්තවාදය ( Monophysifism ) පිළිබඳ විග්‍රහයක්

    ඇ. ක්ලුනි (Cluny) තාපසාරාමයේ ආරම්භය සමග වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය

    ඈ. ක්‍රිස්තියානි සභාව හා ප්‍රංශ විප්ලවය

    ඉ. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ වැදගත්කම

## දෙවන කොටස

05. පෘතුගීසි යුගයේ කෝට්ටේ ධර්මපාල රජ සමයේ කතෝලික දහමේ ව්‍යාප්තිය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් ලියන්න.

06. ජුසේවාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති ඇගයීමට ලක් කරන්න.

07. බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආගමික ප්‍රතිපත්තිය පැහැදිළි කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකක් (02)</u>** පිළිබඳ සටහන් ලියන්න..

අ. ජාකොමේ ගොන්සල්වෙස් පියතුමාගේ සාහිත්‍යමය දායකත්වය

ආ. ශ්‍රී ලංකාවේ මෙතෝදිස්ත සභාව

ඇ. නිදහසින් පසු යුගයේ පැවති කිතුණු අධ්‍යාපනය

ඈ. ලංකාවේ අන්තර් කිතුණු නිකායික ව්‍යාපාරය (Christian Ecumenical movement in Sri Lanka)